# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2293/13 - 2022 අගෝස්තු මස 15 වැනි සඳුදා - 2022.08.15**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

**1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ යොමු අංකය* :- KDS/PAN/04/04/02/25.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* :- 4-3/8/2014/PC/323.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබාගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර:*

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, පන්විල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 729 පන්විල ග්‍රාම නිලධාරි වසමේ උඩකුඹුර ග්‍රාමයේ පිහිටි සර්වේයර් ජනරාල්ගේ අංක මූ.පි. මහ 7118 දරන 2021.11.27 දිනැති මූලික පිඹුරේ සඳහන් මුළු ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.4346 ක් පමණ වූ පහත සඳහන් විස්තර හා සතර මායිම්වලින් සමන්විත ඉඩම :

**කැබලි අංකය : 1**
ඉඩමේ නම: ගල්පිහිල්ලවත්ත; ඉඩමේ ප්‍රමාණය: හෙක්. 0.4346.
සතර මායිම් :

| | | |
|---|---|---|
| *උතුරට* | - | රාජ්‍ය වැවිලි සංස්ථාව හිමිකම් කියන ගල්පිහිල්ලවත්ත සහ මාර්ගය (ප්‍රාදේශීය සභා) |
| *නැගෙනහිරට* | - | මාර්ගය (ප්‍රාදේශීය සභා) |
| *දකුණට* | - | මාර්ගය (ප්‍රාදේශීය සභා) පඩිපෙළ සහ ආර්. වයි. අබේසිංහ සහ තවත් අය හිමිකම් කියන දෙණියේ කුඹුර |
| *බටහිරට* | - | ආර්.වයි. අබේසිංහ සහ තවත් අය හිමිකම් කියන දෙණියේ කුඹුර |

හිමිකම් කියන්නාගේ නම හා ලිපිනය - රාජ්‍ය වැවිලි සංස්ථාව, අංක 21, මිරානියා වීදිය, කොළඹ 12.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2022 ඔක්තෝබර් මස 17 වැනි දින ප.ව. 2.00ට පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතුය.

තව ද, 2022 ඔක්තෝබර් මස 05 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම/ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන්, එකී ඉඩම/ පරවශතාවයට ලබා ගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම්දිය යුතුය.

**නිරංජන් ශ්‍රීමන්ත සේනාධීර,**
ප්‍රාදේශීය ලේකම්,
පන්විල කොට්ඨාසය.

2022 අගෝස්තු මස 10 වැනි දින,
පන්විල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 08-0134